සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

සැළකිය යුතුයි
* පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක (02) බැගින් හිමි වේ.
* දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

### I කොටස

● අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සුද්දෝධන මහරජතුමාගේ සහ මහා ප්‍රජාපතී ගෝතමී කුමරියගේ පුතනුවන් වූයේ.
    1. නන්ද කුමරුය
    2. ආනන්ද කුමරුය
    3. සිදුහත් කුමරුය
    4. චුල්ල පන්තක කුමරුය

02. බුදුරජාණන් වහන්සේ මහජන මතයට ගරුකල ශාස්තෘවරයෙක් බව පෙන්වන අවස්ථාවකට නිදසුනකි.
    1. අෂ්ටගරුධර්ම පනවා කාන්තා පැවිද්ද ඇතිකල අවස්ථාව
    2. කුඹල්හලේදී පුක්කුසාති හමුවූ අවස්ථාව
    3. රජගහනුවර සිටුතුමාගේ ඉල්ලීම පරිදි භික්ෂූන් වහන්සේලාට විහාර වර්ග පහක් අනුමත කළ අවස්ථාව
    4. සුභද්‍ර පිරිවැජියාට ධර්ම දේශනා කල අවස්ථාව

03. වෙනත් කටයුතු පසෙකලා තම සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මරත්නය
    1. ඒහිපස්සික නම් වේ.
    2. ඕපනයික නම් වේ.
    3. අකාලික නම් වේ.
    4. ස්වාක්ඛාත නම් වේ.

04. බුදුරජාණන් වහන්සේ සියළු දෙවිමිනිසුන්ගේ ශාස්තෘවරයා වන බැවින්
    1. බුද්ධනම්වන සේක.
    2. අනුත්තර පුරුෂධම්ම සාරතී වන සේක.
    3. ලෝක විදූ නම් වන සේක.
    4. සත්ථා දේව මනුස්සානම් වනසේක.

05. නන්දෝපනන්ද නම් නාග රාජයා දමනය කරනු ලැබූයේ
    1. බුදුරජාණන් වහන්සේ විසින් ය.
    2. මුගලන් මහ රහතන්වහන්සේ විසින් ය.
    3. සැරියුත් මහ රහතන්වහන්සේ විසින් ය.
    4. මහා කාශ්‍යප මහ රහතන්වහන්සේ විසින් ය.

අංක 6-10 තෙක් දී ඇති වගන්ති හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. යමෙකු මුලදී පමා වී සිට පසුව අප්‍රමාදව කටයුතු කරයි නම් හෙතම දියුණුවට පත් වේ. ( )
07. උපතිස්ස හා කෝලිත යන දෙදෙනාගේ ගිහිකල ගුරුවරයා සෝණදණ්ඩ බමුණාය. ( )
08. කරන කියන හැම දෙයක් ගැනම විමසිලිමත්ව කටයුතු කිරීම අගසව් චරිත දෙකෙන් අපට ගත හැකි එක් ආදර්ශකි. ( )
09. මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයට ලොල් වීම මහා සාවද්‍ය අකුසලයකි. ( )
10. සමථ භාවනාවට අයත් අනුස්සති ගණන දහයක් වේ. ( )

- අංක 11-15 දක්වා ඇති වාක්‍යවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුලින් තොරා හිස්තැන මත ලියන්න.
  (ලෝකවිදූ/අස්සජී/කිඹුල්වත්නුවර/මුගලන්/රජගහනුවර)

11. දෙව් මිනිස් බඹ යන ලෝකවල සැබෑතත්වය අවබෝධ කල බැවින් බුදුරජාණන් වහන්සේ .......................... නම් වන සේක.
12. කාලසිලාවට වැඩමවා එහිදී පිරිනිවන් පා වදාලේ .......................... මහරහතන් වහන්සේය.
13. සුදත්ත සිටුවරයා බුදුරජාණන් වහන්සේ හමුවූයේ .......................... දීය.
14. "යේධම්මා හේතුප්පභවා" යන ගාථාවෙන් ධර්ම දේශනා කලේ .......................... මහරහතන් වහන්සේය.
15. දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරණ ලෙස බුදුරජාණන් වහන්සේ ශික්ෂාපදයක් පනවා වදාළේ .......................... දීය.

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවේ තිබෙන වරහනෙහි යොදන්න.

| A | | B |
|---|---|---|
| 16. පොල්මල් හනස්සෙන් ඉරා ගත් තීරුවලින් සකස් කල දරණුව හැඳින් වූයේ | ( ) | 1. සැරියුත් හිමියන් |
| 17. පාඩම් කරන්න බැරිනම් ආපසු ගෙදර යන්න යැයි සොයුරු භික්ෂුවට ප්‍රකාශ කලේ | ( ) | 2. රාජගහ ලෙසයි |
| 18. පිළිවෙත් පුරණවා යැයි නිතර මළුව ඇමදීම පමණක් නොකල යුතු යැයි ප්‍රකාශ කලේ | ( ) | 3. වලයම ලෙසයි |
| 19. යුගාසන පුටුවලට පිටුපසින් පුවක් පැලයක් තබා සකස් කරන ලද අංගය හැඳින්වූයේ | ( ) | 4. මහාපන්ථක හිමි ය |
| 20. අස්සජී නම් බුද්ධ ශාවකයන් වහන්සේ සිටින දිශාවට මම හිසලා සැතපෙමි යැයි ප්‍රකාශ කලේ | ( ) | 5. රේවත හිමියන් |

---

## II කොටස

- පලමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- පලමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද 2 සිට 7 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1.
   i. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පානා ලද්දේ කුමණ ස්ථානයකදී ද?
   ii. ගිහියාගේ නිත්‍ය සීලය වන්නේ කුමක්ද?
   iii. "මහනෙල් සුවඳමය කුඩමසු පිළී ගඳමය" ...... යන කවියේ ඉතිරි පද දෙක ලියන්න.
   iv. බුදු දහමට අනුව කර්මයේ ආකාර දෙක ලියන්න.
   v. ප්‍රඥාවන්තයින් හා ඍද්ධිමතුන් අතර අගතැන්පත් තෙරවරුන් දෙදෙනා නම් කරන්න.
   vi. ධම්මපදය නම් ග්‍රන්ථය අයත් වන නිකාය හා වග්ග ගණන ලියන්න.
   vii. කාව්‍ය ශේඛරය නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
   viii. කයෙන් සිදුවන අකුසල කර්ම දෙකක් නම් කරන්න.
   ix. සිව්වනක් පිරිස නම් කරන්න.
   x. සිරිත් හා විරිත් යන්නෙහි අදහස ලියන්න.

2. i. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන පාලි පාඨයෙහි අදහස ලියන්න. (ල. 02)
   ii. වචනයෙන් සිදුවන අකුසල කර්ම තුනක් ලියන්න. (ල. 03)
   iii. කේලම්කීම නරක ක්‍රියාවක් වන්නේ කුමක් නිසා දැයි පැහැදිලි කරන්න. (ල. 05)

3. i. "යස්ස පාපං කතං කම්මං ........." යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ල. 02)
   ii. එහි අදහස ලියන්න. (ල. 03)
   iii. කුසල් කිරීමෙන් ඔබට සිදුවන යහපත කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 05)

4. i. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව කුමක්ද? (ල. 02)
   ii. පංචස්කන්ධයෙන් තුනක් නම් කරන්න. (ල. 03)
   iii. ඔබගේ මව හෝ පියා අසනීප වී දුකට පත් වී සිටිනවා යැයි සිතන්න එම අවස්ථාවේදී මවට හෝ පියාට ඔබ පිහිට විය යුත්තේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ල. 05)

5. i. ගිහි විනය ලෙස හඳුන්වනු ලබන යුතුකම් ඉටු කිරීම පිළිබඳව සඳහන් වන සූත්‍ර දේශනාව කුමක්ද? (ල. 02)
   ii. එහි සඳහන්වන ස්වාමියා විසින් භාර්යාවට ඉටුකල යුතු යුතුකම් තුනක් නම් කරන්න. (ල. 03)
   iii. "ස්වාමියා සහ භාර්යාව අතර ආරවුල් ඇති වීම දරුවන්ගේ පරිහානියට ඉවහල් වේ" මේ බව පැහැදිලි කරන්න. (ල. 05)

6. i. සීලය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)
   ii. අටසිල්පදවලින් පළමු, දෙවන හා තෙවන සිල් පද තුන ලියන්න. (ල. 03)
   iii. සිල් සමාදන් වීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 05)

7. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.
   i. තණ්හාව
   ii. කර්මය
   iii. නන්ද හාමුදුරුවෝ
   iv. චුල්ල පන්ථක හිමියන්